උකුවෙල ප්‍රාදේශීය සභාව
<u>මාතලේ දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 27 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට උකුවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අත්තිකාරම් ලේඛනය අනුව ශේෂයක් නොතිබූ නමුත් ලෙජර් ගිණුම අනුව තිබූ රු.123,090 ක බැර ශේෂය සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට යන්ත්‍ර උපකරණ ගිණුමේ පැවති රු.26,308,914 කින් රු.20,977,591 ක් ස්ථාවර වත්කම් සමීක්ෂණය අනුව ශේෂය නිවැරදි කිරීම ලෙස දක්වා ජ'නල් සටහන් 35 මඟින් ලෙජර් ගිණුමෙන් ඉවත් කර තිබුණි.

(ඇ) සභාව සතුව පැවති රු.1,600,000 ක් වූ මාර්ග තලනය යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ගිණුමේ මෙන්ම මෝටර් රථ හා කරත්ත ගිණුමේ ද ඇතුළත් වීමෙන් ස්ථාවර වත්කම් ශේෂය සමාන වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.392,998 ක් වූ කර්මාන්ත වියදම පුනරාවර්ථන වියදම් යටතේ දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රාග්ධන ආධාර රු.1,209,679 ක් අඩුවෙන් සහ ප්‍රාග්ධන වියදම රු.5,302,318 ක් වැඩියෙන් දැක්වුණි.

(ඊ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2016 වර්ෂය තුළ ලැබී තිබූ රු.700,000 කට අදාළ කර්මාන්ත 2 ක් ඉටු කිරීමට 2017 වර්ෂය තුළ ද කටයුතු කර නොතිබියදී එම මුදල ණයහිමි ලෙස ගිණුම්වල දැක්වීමෙන් ණයහිමි ශේෂය රු.700,000 ක් වැඩියෙන් දැක්වුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.484,027 ක ස්ථිර තැන්පතු පොලිය ගිණුම්ගත කර නොතිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජූනි දක්වා මුද්දර ගාස්තු රු.8,100,700ක් වුවත්, ජූලි සිට දෙසැම්බර් කාල පරිච්ඡේදයට මුද්දර ගාස්තු ආදායම ප්‍රතිපාදනය කිරීමේදී රු.24,302,310 ක් ලෙස ගිණුම්වල අධි ප්‍රතිපාදනයක් කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවියයුතු ණය ශේෂය රු.145,009 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබියයුතු උසාවි දඩ අධි වෙන් කිරීම වූ රු.92,477ක් ගැලපීම වෙනුවට රු.367,227 ක් සමුච්චිත අරමුදලට ගැලපීම හේතුවෙන් රු.274,750 ක් වැඩියෙන් සමුච්චිත අරමුදලට හර කර තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.107,335 ක් වටිනා ආයුර්වේද තොගය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඕ) කසළ මධ්‍යස්ථානයේ සේවය කරන පුද්ගලයින් දෙදෙනෙකුගේ සමාලෝචිත වර්ෂයට අදාළ දෛනික වැටුප් රු.569,000 ක් වැටුප් වියදම යටතේ නොගෙන ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක හා වෙනත් සේවා යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ක) 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 2.2.1 ඡේදයෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

----------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.99,206,134 ක් වූ ගිණුම් විෂයයන් 7 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් දක්නට ලැබුණු අතර, නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.23,167,353 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

(අ). ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 6 ක එකතුව රු.21,862,060 ක් වූ අතර, ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව ඊට වර්ෂ 3කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවී පවතින රු.175,676 ක ශේෂයක් ඇතුළත්ව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 8 ක එකතු වටිනාකම රු.11,322,334 ක් වූ අතර ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින රු2,061,429 ක ශේෂ ඊට ඇතුළත් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.

----------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

---------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.53,476,859 ක් වූ ගිණුම් විෂයයන් 4 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1893 අංක 9 දරන ගෝඝාතකාගාර ආඥා පනත | | |
| | (i) 6 වන වගන්තිය | - | සභා බලප්‍රදේශය තුළ පවත්වාගෙන යන ඝෝගාතකාගාරය වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීමේදී පනතේ ආකෘති ප්‍රකාරව ඇපකාරයන් දෙදෙනෙකු සාමූහිකව හා වෙන් වෙන්ව පොරොන්දුවට බැඳෙන්නාවූ ඇප ඔප්පුවක් සකස් කොට ලබා දී නොතිබුණි. |
| | (ii) 10 වන වගන්තිය | - | ගෝඝාතකාගාරයේ එක් එක් මාසයේදී මරන ලද සියළුම ගවයින්ගේ විස්තර සභාවේ ලේකම්වරයාගේ කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | |
| | (i) 177 රීතිය | 216,000 | ටෙන්ඩර් පරිපාටි අනුගමනය නොකර කසල භූමියේ සේවය සඳහා එක්ස්කැවේටර් යන්ත්‍රයක් කුලියට ලබා ගෙන තිබුණි. |
| | (ii) 178 (8) රීතිය | - | ටෙන්ඩර් පිළිබඳ උප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) | චක්‍රලේඛ හා වෙනත් | | |
| | (i) 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 5 වගන්තිය | - | පොදු වෙළඳපල කඩ 48 ක් සම්බන්ධයෙන් නව තක්සේරුවක් ලබා නොගෙන 2010 වර්ෂයේ ගිවිසුම්ගත වූ කඩ කුලී ආදායම සමාලෝචිත වර්ෂය සඳහාද අයකර තිබුණි. |
| | (ii) 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | | වසර 5 කට වරක් වරිපනම් බදු අයකරනු ලබන ප්‍රදේශවල දේපල තක්සේරු කරගතයුතු වුවත්, සභාව 2007 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයටද වරිපනම් අයකර තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,328,696 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,232,422 ක් විය.

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම ඉහල අගයක් ගැනීම සඳහා ජූලි සිට දෙසැම්බර් කාලයට අදාළ ලැබියයුතු මුද්දර ගාස්තු සඳහා රු.24,302,310 ක අධි ඇස්තමේන්තු කිරීම බලපා තිබුණි.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්
---------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 812,345 | 868,738 | 514,779 | 548,721 | 810,000 | 876,867 | 112,448 | 786,657 |
| (ii) | කුලී | 2,150,000 | 2,778,668 | 2,731,435 | 48,809 | 2,200,000 | 2,574,179 | 2,535,538 | 38,641 |
| (iii) | බලපත්‍ර | 1,000,000 | 1,393,430 | 1,393,430 | - | 1,400,000 | 1,884,785 | 1,884,785 | - |
| (iv) | වෙනත් ආදායම් | 4,500,000 | 4,467,671 | 3,067,730 | 1,736,577 | 4,500,000 | 4,410,911 | 2,936,647 | 1,710,835 |

2.2.2 වරිපනම් හා බදු
------------------

(අ) වරිපනම්
----------

(i) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි වරිපනම් බදු ශේෂය රු.548,721 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 3 ට වඩා වැඩි කාලයකට අයත්, රු.128,312 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ii) සභාව 2014/2015 වර්ෂයේදී නව වරිපනම් බදු තක්සේරුවක් කර තිබූ අතර එහි පැවති අඩුපාඩු නිවැරදි කර නොගැනීම හේතුවෙන් 2017 වර්ෂය සඳහා 2007 වර්ෂයේ පැවති තක්සේරුව මත වරිපනම් අයකර තිබුණි.

(iii) භාවිතා කරන පරිගණක මෘදුකාංග දැනට අක්‍රීයව පැවති අතර, ශේෂය ලබා ගැනීමේදී වරිපනම් ලේඛනය අනුව ශේෂය ලබා ගැනීමට තොරතුරු ඇතුළත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි.

(ආ) අක්කර බදු

--------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි අක්කර බදු ශේෂය රු.31,333 ක් වූ අතර, මෙම ශේෂ වසර 7 ක කාලයක සිට අය නොවී පැවතුණි.

2.2.3 වෙනත් ආදායම්

------------------

(අ) කසල ගාස්තු

---------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි කසල ගාස්තු ශේෂය රු.13,531 ක් වූ අතර, එම ශේෂය වසර 3 කට වැඩි කාලයක සිට අය නොවී පැවතුණි.

(ආ) ජල ගාස්තු

------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ජල ගාස්තු ශේෂය රු.1,736,577ක් විය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබූ උසාවි දඩ රු.495,250 ක් හා මුද්දර ගාස්තු රු.15,336,543 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

බල ප්‍රදේශයේ නැවතුම්හල් 36 ක ත්‍රීරෝද රථ 319 ක් නවතා තබන බව හඳුනාගෙන ඒ සඳහා නවතා තැබීමේ ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.46,800 ක් අයකර තිබුණු නමුත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(vii) (ඌ) ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

-------------------------------------

සභාව සතුව යහපත් මූල්‍ය තත්ත්වයක් තිබියදී අයවැය ලේඛනය අනුව ඉටු කිරීමට යෝජිතව තිබූ සංවර්ධන යෝජනා ඉටු නොකර සමාලෝචිත වර්ෂය තුළ ස්ථිර තැන්පත් 2 ක රු.13,000,000 ක් ආයෝජනය කර තිබුණි.

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම.
----------------------------------------

සමාලෝචිත වර්ෂයේ එක් කර්තව්‍යයක් ඉටු කිරීම වෙනුවෙන් රු.1,993,080 ක් වැයකර තිබූ නමුත් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගෙන නොතිබුණි.

(ඈ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්
------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ අයවැය ප්‍රතිපත්ති අනුව ඉටුකිරීමට අපේක්ෂිතව තිබූ කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කිරීම, තැන්න මහජන පුස්තකාලය ආශ්‍රිතව ළමා උද්‍යානයක් ඉදිකිරීම හා ඇල්කඩුව පරිසර උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම යන කර්තව්‍යයන් ඉටුකර නොතිබුණි.

(ii) අයවැය ප්‍රතිපාදන යටතේ ඉටු කිරීමට යෝජිතව ප්‍රධාන ලේකම්වරයාගේද අනුමැතිය ලැබී තිබූ රු.3,071,580 ක් වටිනා ව්‍යාපෘති 3 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි.

(iii) ප්‍රතිපාදන මුදල ඉක්මවා ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් අනුමැතිය නොලැබීම මත ඇස්තමේන්තුගත වටිනාකම රු.239,167 ක් වූ ව්‍යාපෘති 2 ක් ඉටුකර නොතිබුණි.

(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
-------------------------------

සභා බල ප්‍රද්ශයේ දෛනිකව එකතුවන කසළ ටොන් 4 සිට 4½ ප්‍රමාණයකින් ටොන් 1 ක නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණයට යොදාගෙන දිරන කසළ ටොන් 1 ක් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා භාවිතා කරමින් තිබුණි. ඉතිරි නොදිරන කසළ ටොන් 2½ ක් හානිදායක ලෙස කසළ කළමනාකරණ ගොඩනැගිල්ල අසළ භූමියට බැහැර කරන බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළ පොහොර කිලෝ ග්‍රෑම් 3115 ක් නිෂ්පාදනය කර තිබූ අතර, රු.58,440 ක ආදායමක් උපයාගෙන තිබුණි.

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක
------------------------------

(i) තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොතිබීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැළසුම් 2018 මැයි 30 දින වන විටත් සකස්කර නොතිබුණි.

(ii) 2018 ජූනි 11 දින වන විට දිළිඳුකම පිටුදැකීම යන අරමුණු යටතේ ඉලක්ක හඳුනාගෙන 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂාකර තිබූ නමුත් එකී ඉලක්ක ළඟාකර ගැනීමට අදාළ කාර්යයන් නියාමනය සඳහා වූ ක්‍රමවේදයන් හඳුනාගෙන නොතිබුණි. එමෙන්ම ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොවීම හා සම්පත් අවම වීම යන ගැටළු හේතුවෙන් එකී ඉලක්ක ළඟාකර ගැනීම ගැටළු සහගත තත්ත්වයක පැවතුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) පැමිණීම හා පිටවීම පැමිණීම් ලේඛනයේ සටහන් නොකර නිවාඩු දින වැඩ ඉටු කිරීම වෙනුවෙන් සභාවේ ලේකම්වරයාට රු.97,639 ක් නිවාඩු දින වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78(1) වගන්තිය ප්‍රකාරව සභාව සිය බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය ප්‍රරෝහණය කිරීමේ හා ආරක්ෂා කිරීමේ පොදු පරිපාලන අධිකාරිය ලෙස කටයුතු කළයුතු වුවත්, සභා බල ප්‍රදේශය තුළ සභාව මඟින් නඩත්තු කරන ජල යෝජනා ක්‍රම 4 ක ජලයේ යෝග්‍යතා පරීක්ෂණ සිදුකර නොතිබුණු අතර, ප්‍රජා මූල සංවිධාන මඟින් පාලනය වන ජල ව්‍යාපෘති 16 කින් ව්‍යාපෘති 11 ක ජල යෝග්‍යතා පරීක්ෂණ අනුව ජලය පානයට නුසුදුසු මට්ටමක පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ඇප තැන්පත් ගිණුමේ ශේෂය වූ රු.143,242කින් විශ්‍රාම ගිය හා ස්ථානමාරු වී ගිය නිලධාරීන්ට අදාළ සේවක ඇප තැන්පත් රු.50,660 ක් ආයෝජන ගිණුමෙන් ඉවත් කර මුදල් පොතට ගෙන තිබූ නමුත්, අදාළ නිලධාරීන්ට ගෙවා නිරවුල් කර නොතිබුණි.

(ඈ) ආදායම් ණයගැතියන් තුළ 2011 වර්ෂයේ සිට පැවත එන රු.560,776 ක දේපළ ණය පොළියක් පැවැති අතර, සභාව එම වටිනාකම හඳුනාගෙන ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සභාව සතු ඉඩම් 97 කින් ඉඩම් 23 ක් සඳහා පමණක් ඔප්පු හා පැවරුම් නියෝග ලබාගෙන තිබුණි.

(ඊ) 2013 සිට 2015 වර්ෂවලට අදාළව පැවති රු.317,217 ක් වටිනා කර්මාන්ත ණයහිමි ශේෂ 9 ක් සම්බන්ධයෙන් අදාළ ලිපිගොනු පරීක්ෂාකර නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

(උ) 2014 වර්ෂයේ ඉටු කරන ලද කර්මාන්ත 9 කට අදාළව මාර්ග පුවරු සඳහා ලැබී තිබූ රු.36,000 ක් අදාළ මාර්ග පුවරු සකස් නොකිරීම මත ණයහිමි කර තිබූ අතර ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) සභාව විසින් සකස් කළයුතු ප්‍රාදේශීය සභා වාර්තා වලින් ප්‍රාදේශීය සභා 7 හා 19 වාර්තා සභාව සකස් කොට නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

(අ) ප්‍රාදේශීය සභාව සඳහා අනුමත තනතුරු 9 ක පුරප්පාඩු 22 ක් දීර්ඝ කාලීනව සම්පූර්ණ කර ගැනීමට කටයුතු නොකිරීම සභාව තුළින් ඉටු කළයුතු මහජන සේවාවන් සීමා වීමට හේතු වී තිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 අනුව 2014 වර්ෂයේදී පත්වීම් ලැබූ සේවකයින් 6 දෙනෙකුගේ අධ්‍යාපන සහතික 2018 මාර්තු වන විටත් සනාථ කරගෙන නොතිබූ බැවින් සේවයේ ස්ථිර කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පුරප්පාඩුව පැවති පුස්තකාල සහායක තනතුරු 1 ක් හා කාර්යාල කාර්ය සහායක තනතුරු 2 ක් බඳවා ගැනීම සඳහා අයදුම්කරුවන් 326 ක් අතරින් 3 දෙනෙකු

තෝරාගෙන තිබූ අතර, ඒ සඳහා දින 6 ක් නිලධාරීන් 5 දෙනෙකු සේවයේ යොදවා ඒ වෙනුවෙන් සංග්‍රහ වියදම් රු.19,861 ක් දරා තිබුණද, පදනමකින් තොරව අදාළ බඳවා ගැනීම් අවලංගු කර තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් බදු ගිවිසුමකට එළඹීමකින් තොරව සභාවට අයත් පොදු වෙළඳපලේ අංක 17 දරන මස් කඩය බදු දී තිබුණු අතර, මස් කඩය සඳහා මස් සපයා ගන්නා පුද්ගලයාගේ, අනුමත ගවඝාතකාගාරයේ බලපත්‍රයේ පිටපතක් සභාවට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම ගවමස් කඩයේ බදුකරු අදාළ මස් ගලේවෙල ගෝඝාතකාගාරයකින් ලබා ගන්නා බව ලිඛිතව දන්වා තිබූ නමුත් එම ගෝඝාතකාගාරය සඳහා ගලේවෙල ප්‍රාදේශීය සභාවෙන් නිකුත්කළ බලපත්‍රයක් ඉදිරිපත් නොකෙරුණි.

3.5 වත්කම් කළමනාකරණය

-----------------------------

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

සභාව සතු රු. 282,500 ක් වටිනා සිමෙන්ති මිශ්‍රණ යන්ත්‍රය නිෂ්ක්‍රීයව පැවතුණි.

3.6 හඳුනාගත් අලාභ

------------------

අනාරක්ෂිතව සභාවේ වාහන නවතා තැබීම හේතුවෙන් JCB යන්ත්‍රයේ වම්පස දොරේ වීදුරුව කැඩී ගොස් තිබූ අතර අදාළ වීදුරුව රු.80,000 ක් බව රථයේ නියෝජිත ආයතනය දන්වා තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් පරීක්ෂණයක් කර නොතිබූ අතර අදාළ හානිය ලේඛනයක සටහන් කර නොතිබුණි.

3.7 ප්‍රසම්පාදනය

---------------

3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්, සිවිල් වැඩ, භාණ්ඩ හා වෙනත් සේවා ඇතුළත් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබූ අතර 2017 ජනවාරි සිට නොවැම්බර් දක්වා රු.4,598,481 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි.

3.7.2 සැපයුම් හා සේවා

--------------------

(අ) කැබ් රථයක් අලුත්වැඩියා කිරීම

-----------------------------------

කැබ් රථයක් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 2017 මාර්තු 07 දිනැතිව පෞද්ගලික ආයතනයක් වෙත රු.322,691 ක් ගෙවා තිබීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) වාහනයේ එන්ජිම අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කිරීමට පෙර කළයුතු අළුත්වැඩියාවන් සම්බන්ධයෙන් මෝටර්රථ පරීක්ෂකවරයෙකුගේ හෝ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශයන් ලබා නොගෙන, එන්ජින් අළුත්වැඩියාව ලෙස පමණක් දක්වා ආයතන තුනකින් මිල ගණන් කැඳවා තිබුණි.

(ii) ලද මිල ගණන් 2017 ජනවාරි 06 දින විවෘත කළ බවට දින මුද්‍රා තබා ප්‍රසම්පාදන කමිටුව අත්සන් යොදා තිබූ නමුත් ඊට පෙර දිනයක් වූ 2016 දෙසැම්බර් 30 දින තීරණ අංක 819 ප්‍රකාරව අදාළ ටෙන්ඩර්කරු තෝරාගෙන තිබුණි.

(iii) අළුත්වැඩියාව සිදුකළ ආයතනය 2017 මාර්තු 10 දින ඉදිරිපත්කළ රු.322,691ක් වූ අවසන් බිල්පත සඳහා ඊට පෙර දිනයක් වූ 2017 මාර්තු 09 දින ගෙවීම් කර තිබූ අතර, අළුත්වැඩියාව නිසි පරිදි ඉටුකර ඇති බවට යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ සහතිකයක් ලබාගෙන නොතිබුණි.

(ආ) ගුරුලවෙල දකුණු සුහද ප්‍රජා මූල සංවිධානයේ ජල යෝජනා ක්‍රමය සඳහා ජල මෝටර් මිලදී ගැනීම.

-----------------------------------------------------------------------------------------

යථෝක්ත ජල ව්‍යාපෘතිය සඳහා රු.1,264,175 ක් වැයකර ජල මෝටර් 2 ක් මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් නිර්දේශ ලබාගෙන නොතිබූ අතර, සවිකර මාස 3 ක් පමණ කෙටිකාලයක් තුළ එක් ජල මෝටරයක් අක්‍රීය වී පැවතුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

අයවැය පාලනය

--------------------

(අ) ආදායම් විෂයයන් 17 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර විචලනය සියයට 52 සිට සියයට 57415 අතර පරාසයක පැවතුණි.

(ආ) වැය විෂයයන් 13 ක් සඳහා සලසා දී තිබුණු රු.2,185,000 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 24 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර, සියයට 42 සිට සියයට 98 අතර, පරාසයක විචලනයක් පැවතුණි.

5. පද්ධති හා පාලනය

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය .

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම.<br>(ii) පොදු ලෙජරය විධිමත්ව පවත්වා නොතිබීම.<br>(iii) ප්‍රාදේශීය සභා වාර්තා විධිමත්ව පවත්වා නොතිබීම. |
| (ආ) | කාර්ය මණ්ඩල කළමනාකරණය | අනුමත තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම. |
| (ඇ) | වත්කම් කළමනාකරණය | වත්කම් නිවැරදිව ගිණුම්ගත නොකිරීම. |
| (ඈ) | අයවැය පාලනය | (i) ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම.<br>(ii) ආදායම් ඉලක්ක සපුරා නොගැනීම. |